



**නීතිඥ උදය ගම්මන්පිල**

Udaya Gammanpila Attorney at Law

පාර්ලිමේන්තු මන්ත්‍රී Member of Parliament

නායක - පිවිතුරු හෙළ උරුමය Leader - Pivithuru Hela Urumaya


2022 ඔක්තෝම්බර් 9 දින

අධ්‍යක්ෂතුමා
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
පොලිස් මූලස්ථානය
කොළඹ 01

හිතවත් අධ්‍යක්ෂතුමනි

**තිලිණි ප්‍රියමාලිට මුදල් ලබා දුන් අය ලෙස ව්‍යාජ නම් ලැයිස්තුවක් සමාජ ජාලාවන් හි සංසරණය වීම**

2022 ඔක්තෝම්බර් 8 දින සිට තිලිණි ප්‍රියමාලිට මුදල් ලබා දුන් අය ලෙස ව්‍යාජ නම් ලැයිස්තුවක් සමාජ මාධ්‍ය තුල සීඝ්‍රයෙන් පැතිරෙමින් තිබේ. එහි උදය ප්‍රභාත් ගම්මන්පිල වන මගේ නම ද තිබේ.

එකී තැනැත්තිය මා නොදන්නා අතර ඇය සමග මා කිසිම අයුරකින් ගනුදෙනු කර නොමැත. එබැවින් මට අපහාස කිරීමේ ද්වේශ සහගත අරමුණින් මෙන්ම ජනතාව රැවටීමේ අරමුණින් ද මෙම ව්‍යාජ නම් ලැයිස්තුව සමාජ ජාලාවන්ට එක් කර ඇති බව පෙනේ.

එකී ව්‍යාජ ලැයිස්තුව 077115 6617 යන අංකයෙන් **UK News Line** යන වට්ස්ඇප් සමූහයට ද **077251 5932** යන අංකයෙන් **Lawyers for Rising** යන වට්ස්ඇප් සමූහයට ද **077732 0504** යන අංකයෙන් **Lanka On** යන වට්ස්ඇප් සමූහයට ද එක් කර ඇත (ඒ පිළිබඳ තිරරූප (**screenshots**) ඇමිණුම් 1 සිට 3 දක්වා ලකුණු කර මේ සමග ඉදිරිපත් කර ඇත). එකී අංක හිමියන් ඉතාම වගකීම් විරහිත ලෙස මෙම ව්‍යාජ ලේඛණය වට්ස්ඇප් සමූහයන්ට එක් කර ඇත. ඔවුන්ට එකී ව්‍යාජ ලේඛණය ලැබුණු ආකාරය විමර්ශනය කිරීමෙන් මෙම ව්‍යාජ ලේඛණය සැකසීම පිළිබඳ වගකිවයුත්තන් හඳුනා ගැනීමට හැකි වනු ඇත.

මේ පිළිබඳ කඩිනමින් විමර්ශනය කර එකී ව්‍යාජ ලේඛණය සැකසූ වංචනිකයින් හඳුනා ගෙන නීතිය ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලා සිටිමි.

මෙයට දේශප්‍රේමීත්වයෙන්

උදය ගම්මන්පිල


අංක 448 කෝට්ටේ පාර පිටකෝට්ටේ  No 448 Kotte Road Pitakotte Sri Lanka

(+94) 11 2877628  (+94) 11 2877626  www.udayagammanpila.com  UdayaGammanpilaFanPage

udaya.gammanpila@ymail.com  @UPGammanpila  udayagammanpila

ඇමිණුම 1

20:36 4G

2,026 **UK News Line**
Ajith, Anoma Janadaree (Actress...

08:57

+94 77 115 6617 ~Sunalie Ratnayake
Forwarded





Forwarded
ගවේෂණශීලි මාධ්‍යවේදියා හෙළිකරයි - Investigative Journalist leaks...
තිළිණි ප්‍රියමාලිට හසු වූ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ලයිස්තුව මෙන්න!
කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ 34 වැනි මහලේ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යමින් ප්‍රකෝටිපතියන්, දේශපාලනඥයන් හා භික්ෂුන් වහන්සේගෙන් කෝටි ගණනක් වංචා කළ කාන්තාවක් පසුගියදා පොලිස් අත්අඩංගුවට පත්වුනා.

ඇමිණුම් 2

20:40 4G

< 2,025 Lawyers for Rising
Ambawatta AAL, Anuradha, Athul...




+94 77 251 5932 ~Dumma

Forwarded

ගවේෂණශීලි මාධ්‍යවේදියා හෙළිකරයි -
Investigative Journalist leaks...
තිළිණි ප්‍රියමාලිට හසු වූ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ලයිස්තුව මෙන්න!
කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ 34 වැනි මහලේ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යමින් ප්‍රකෝටිපතියන්, දේශපාලනඥයන් හා භික්ෂුන් වහන්සේගෙන් කෝටි ගණනක් වංචා කළ කාන්තාවක් පසුගියදා පොලිස් අත්අඩංගුවට පත්වුනා.
අදාල කාන්තාව වංචා කළ මුදල් ඉල්ලූ විට ගණුදෙනුකරුවන් සමග අයුතු ලෙස හැසිරීමට ප්‍රසිද්ධ නිළියන් යොදාගත් බවත් පොලිස් පරීක්ෂණවලදී හෙළි වුනා.
එම කූඨ ජාවාරමේ සියලුම විස්තර සොයා ගවේෂණශීලි මාධ්‍යවේදියා කණ්ඩායම වෙහෙසුනා.

ඇමුණුම 3

20:29 4G

2,033 **Lanka On**
Ananda Palitha (JSS Chairman),...

+94 77 732 0504 ~Tikka

*Forwarded*




*Forwarded many times*

ගවේෂණශීලි මාධ්‍යවේදියා හෙළිකරයි -
Investigative Journalist leaks...
තිළිණි ප්‍රියමාලිට හසු වූ ප්‍රසිද්ධ පුද්ගලයන්ගේ ලයිස්තුව මෙන්න!
කොළඹ ලෝක වෙළෙඳ මධ්‍යස්ථානයේ 34 වැනි මහලේ මූල්‍ය ආයතනයක් පවත්වාගෙන යමින් ප්‍රකෝටිපතියන්, දේශපාලනඥයන් හා භික්ෂුන් වහන්සේගෙන් කෝටි ගණනක් වංචා